# මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
# MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01. இலங்கை. | The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. NP/RD/DCB 2025 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2025.01.29 |

මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ: MF/02/2025

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

## විමධ්‍යගත අයවැය වැඩසටහන - 2025

"පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශය මගින් රටේ ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීමේ අරමුණ ඇතිව නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනැගීම තීරණාත්මක සහ ප්‍රමුඛ කාර්යයක් ලෙස හඳුනාගෙන ඇත. මෙම නිෂ්පාදන ආර්ථිකය ගොඩනැගීම සඳහා දරිද්‍රතාවයෙන් පෙළෙන ජනතාව නිෂ්පාදන කාර්යයට දායක කරගැනීම සහ එම ජනතාවගේ ආදායම් මට්ටම ඉහළ නැංවීම තුළින් ජීවන තත්ත්වය උසස් කිරීම රජයේ ප්‍රමුඛ අපේක්ෂාවයි.

තවද, රජයේ මූලික සංවර්ධන ඉලක්ක වන ග්‍රාමීය දිළිඳුකම පිටුදැකීම, Clean Sri Lanka වැඩසටහන සහ ඩිජිටල් ආර්ථිකයක් ගොඩනැගීම අරමුණු කරගනිමින් රජයේ සංවර්ධන වැඩසටහන් සඳහා ප්‍රමුඛතාවය දෙමින් රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ හඳුනාගෙන ඇති සංවර්ධන අවශ්‍යතාවන් යථාර්ථයක් බවට පත්කිරීම සහ **නිෂ්පාදන ආර්ථිකය පදනම් කර ජාතික සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම** සඳහා 2025 වර්ෂයේ විමධ්‍යගත අයවැය වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.

2025 වර්ෂයේ විමධ්‍යගත අයවැය වැඩසටහන සඳහා ප්‍රතිපාදන **ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවට** අදාළ වැය ශීර්ෂය යටතේ ලබාදීමට කටයුතු කෙරේ. රේඛීය අමාත්‍යාංශ, පළාත් සභා හා වෙනත් ආයතන හා ප්‍රභව මගින් ප්‍රතිපාදන සලසා නොමැති ග්‍රාමීය සංවර්ධනය, දුප්පත්කම අවම කිරීම සහ ජනතාවගේ ආදායම් මට්ටම ඉහළ නැංවීම අරමුණු කරගත් නිෂ්පාදන ආර්ථිකයකට දායකවන භෞතික යටිතල පහසුකම් ඇති කිරීම හෝ වැඩිදියුණු කිරීම සහ ව්‍යාවසායකත්ව සංවර්ධනය උදෙසා විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ වෙන් කරනු ලබන ප්‍රතිපාදන නිසි පරිදි ආයෝජනය කරනු ලබන බවට වග බලා ගැනීම ඔබ වෙත පැවරෙන වගකීමකි.

විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම වඩාත් පහසු කිරීම උදෙසා පහත සඳහන් මාර්ගෝපදේශයන් නිකුත් කෙරේ.

## 1. සංවර්ධන අංශ

1.1 විමධ්‍යගත අයවැය වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සංවර්ධන අවශ්‍යතා හඳුනාගැනීමේ දී පහත ක්ෂේත්‍ර වෙත අවධානය යොමු කළ යුතුය **(ඇමුණුම 1).**

i. ආහාර සුරක්ෂිතතාවය
ii. ජීවනෝපාය නගා සිටුවීම
iii. අගය දාම සංවර්ධනය
iv. යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම
v. ව්‍යාවසායකත්ව සංවර්ධනය
vi. නව තාක්ෂණය හඳුන්වා දීම

1.2 ඉහත සඳහන් ක්ෂේත්‍ර යටතේ ව්‍යාපෘති හඳුනාගැනීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී පොදු හා සාමූහික අවශ්‍යතා සඳහා පමණක් ප්‍රමුඛතාවය ලබා දිය යුතු අතර තනි පුද්ගල ක්‍රියාකාරකම් වලින් බැහැරව විය යුතු බවට අවධාරණය කෙරේ.

## 2. ව්‍යාපෘති හඳුනා ගැනීම

2.1 **2025 පෙබරවාරි 07** වන දිනට පෙර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව කැඳවා මෙම ජාතික වැඩසටහන සම්බන්ධයෙන් දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය.

2.2 විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ඔබගේ **දිස්ත්‍රික්කයට වෙන් කෙරෙන මූල්‍ය ප්‍රතිපාදනය ඇමුණුම 2** වගුවෙහි දැක්වේ.

2.3 ව්‍යාපෘතියක **අවම වටිනාකම රුපියල් මිලියන 1 කි** (රුපියල් ලක්ෂ 10 කි).

2.4 ඉහත අංක 1. සංවර්ධන අංශ යටතට ගැනෙන ඔබගේ දිස්ත්‍රික්යේ පවතින ස්වභාවික සම්පත්, අමුද්‍රව්‍ය, ආර්ථික කටයුතු සඳහා යොදා ගතහැකි භූමි ප්‍රමාණය, පාරිසරික තත්ත්ව, ජනතාවගේ ආර්ථික කටයුතු, ප්‍රදේශයට සුවිශේෂී වූ සංවර්ධන අවශ්‍යතා මෙන්ම දරිද්‍රතාවයෙන් පෙළෙන ජනකණ්ඩායම් පිළිබඳ සැලකිල්ලට ගනිමින් කඩිනමින් ජනතාවට ප්‍රතිලාභ හිමිවන සංවර්ධන අවශ්‍යතා දිස්ත්‍රික්ක හෝ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් හඳුනාගත යුතුය.

2.5 ව්‍යාපෘති හඳුනාගැනීමේ දී, එම ආයෝජනය මගින් නිශ්චිත වශයෙන් ජනනය කරන රැකියා ප්‍රමාණය, ප්‍රාදේශීය සම්පත් උපයෝගීතාව, අගය එකතු කිරීම, වෙළෙඳපොළ, සැපයුම් ජාල, අගය දාම සංවර්ධනය සහ ආදායම් බෙදීයාම වැනි සාධක පිළිබඳව විශ්ලේෂණයක් සිදුකළ යුතුය.

2.6 පෙර වර්ෂ වල දී මෙන්ම මෙම වර්ෂයේදීත් විමධ්‍යගත අයවැය වැඩසටහන සඳහා ව්‍යාපෘති හඳුනාගැනීම සහ සකස් කිරීමේ කාර්යය සඳහා දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂ යටතේ ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කළ යුතුය. මෙම කාර්යය සඳහා දිස්ත්‍රික් ක්‍රමසම්පාදන ලේකම් කාර්යාලයට සහ ප්‍රදේශීය ලේකම් කාර්යයාලවලට අනුයුක්ත නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන් (ක්‍රමසම්පාදන) අනුයුක්ත කිරීමට පියවර ගත යුතුය.

2.7 දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ උපදෙස් පරිදි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සංවර්ධන ව්‍යාපෘති සකස් කර **ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ නිර්දේශය** සහිතව දිස්ත්‍රික් ලේකම්වරයා වෙත යොමු කළ යුතුය.

2.8 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් යොමුකරන සංවර්ධන යෝජනා අතරින් දිස්ත්‍රික්කයට වෙන්කෙරෙන ප්‍රතිපාදන යොදාගනිමින් 2025 වර්ෂය තුල ක්‍රියාත්මක කළ හැකි ඉහළ ප්‍රමුඛතාවයකින් යුතු ව්‍යාපෘති **2025 පෙබරවාරි මස 25 වන දිනට පෙර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව මගින් තීරණය කර අනුමත කළ යුතුය.**

2.9 ඉදිකිරීම් හා අලුත්වැඩියා කිරීම් සඳහා අරමුදල් වෙන් කිරීමට ප්‍රථමව එම ඉදිකිරීම යෝජිත අරමුණ සඳහා අනාගතයේ දී බාධාවකින් තොරව යොදා ගත හැකි බව හා නඩත්තු කටයුතු සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කර ඇති බවට දිස්ත්‍රික් ලේකම් / ප්‍රාදේශීය ලේකම් විසින් සෑහීමකට පත්විය යුතුය.

2.10 මෙම වැඩපිළිවෙළට සමගාමීව යටිතල පහසුකම් සංවර්ධනය, නිෂ්පාදන ආර්ථිකය සහ අගයදාම වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් අයවැය හරහා රේඛීය අමාත්‍යාංශ විසින් සිදුකරන වැඩසටහන් සහ ව්‍යාපෘති සමඟ ද්වීකරණයක් සිදු නොවිය යුතුය.

## 3. ව්‍යාපෘති අනුමත කිරීම, ප්‍රතිපාදන නිදහස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම

3.1 ඔබගේ දිස්ත්‍රික්කයට අදාළව ප්‍රමුඛතාගත කරනු ලැබූ ව්‍යාපෘති / සංවර්ධන යෝජනා **දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය සහිතව 2025 පෙබරවාරි 28** වන දිනට පෙර **ඇමුණුම් 03** ආකෘතිය මඟින් අවසන් අනුමැතිය සහ ප්‍රතිපාදන සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුය.

3.2 එම යෝජනා පරීක්ෂාකර බලා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා **අවසන් අනුමැතිය සහ ප්‍රතිපාදන ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව** විසින් නිදහස් කරනු ඇත.

3.3 2025 විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ අනුමත වූ ව්‍යාපෘති යෝජනා **2025 නොවැම්බර් මස 15** වන දිනට පෙර අවසන් කිරීමට කටයුතු කළ යුතුය.

3.4 විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ අනුමත වූ යෝජිත ව්‍යාපෘති යෝජනාවක් නොවැළැක්විය හැකි හේතුවක් මත හැර **2025 වර්ෂයේ අප්‍රේල් මස 30** වන **දිනෙන් පසුව** සංශෝධනය කිරීමට කටයුතු නොකළ යුතුය.

3.5 සියලුම ව්‍යාපෘති රජයේ අනුමත නීතිරීති, චක්‍රලේඛ, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා මුදල් රෙගුලාසිවලට අනුකූලව ක්‍රියාත්මක වන බවට දැඩිසේ වගබලා ගත යුතුය.

3.6 සංවර්ධන ව්‍යාපෘති, රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2021 යටතේ ප්‍රජා පාදක සංවිධාන වෙත සෘජු කොන්ත්‍රාත් පැවරීමේ දී, එම ප්‍රජා පාදක සංවිධාන වෙත මෙම කාර්යය සිදුකිරීමට ඇති හැකියාව සහ එම සංවිධාන මඟින්ම අදාළ සංවර්ධන කාර්යය ඉටුකරන බවට සහතික විය යුතුය.

## 4. වැඩසටහන අධීක්ෂණය

4.1 2025 විමධ්‍යගත අයවැය වැඩසටහනේ ප්‍රාදේශීය සහ දිස්ත්‍රික්ක මට්ටමේ ප්‍රගතිය සතිපතා සමාලෝචනය කිරීමට කටයුතු කළ යුතුය. ඒ සඳහා දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂ යටතේ නිසි ක්‍රමවේදයක් සකස් කළ යුතුය.

4.2 මෙම සමස්ත වැඩසටහන ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් අධීක්ෂණය කරනු ලබන අතර මහා භාණ්ඩාගාරයේ ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රගතිය සහ අවශ්‍ය තොරතුරු ඔබ වෙතින් ලබාගෙන ජනාධිපති ලේකම් කාර්යාලය වෙත විටින් විට සපයනු ඇත. ඒ සම්බන්ධ උපදෙස් හා මාර්ගෝපදේශ ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉදිරියේ දී නිකුත් කරනු ඇත.

4.3 මෙම වැඩසටහන ඇතුළු ග්‍රාමීය සහ ප්‍රාදේශීය මට්ටමේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති අධීක්ෂණය කිරීම සඳහා **ඩිජිටල් යෙදවුමක්** හඳුන්වාදීමට අපේක්ෂිතය.

## 5. වෙනත් කරුණු

5.1 ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා එක් එක් ව්‍යාපෘතියේ වටිනාකමින් **3%** කට නොවැඩි ප්‍රතිපාදනයක් සහ ඉදිකිරීමක් නොවන ව්‍යාපෘති සඳහා **1%** කට නොවැඩි ප්‍රතිපාදනයක් **පරිපාලන වියදම්** ලෙස වෙන් කළ හැකි අතර එය පහත පරිදි උපයෝජනය කළ යුතුය.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාල ආශ්‍රිත කටයුතු සඳහා 25% උපරිමයකට යටත්ව
(ආ) ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ක්‍රියාත්මක කරන ආයතන ආශ්‍රිත කටයුතු සඳහා 75% උපරිමයකට යටත්ව

5.2 මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් සභා, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් පාලන ආයතන සහ දිස්ත්‍රික්කය තුළ පිහිටි සියලු රාජ්‍ය හා ව්‍යවස්ථාපිත ආයතනවලට අනුයුක්ත තාක්ෂණික නිලධාරීන් සහ තාක්ෂණික සහායක නිලධාරීන්ගේ සේවය උපරිම අයුරින් දායක කර ගත යුතුය.

5.3 විමධ්‍යගත අයවැය වැඩසටහන 2025 ට අදාළ කාල රාමුවට ඇතුළත් ක්‍රියාකාරී සැලැස්ම මේ සමඟ අමුණා ඇත (ඇමුණුම 04).

5.4 මෙම වැඩසටහන යටතේ 2025 වර්ෂය තුළ ක්‍රියාත්මක කර අවසන් කළ හැකි ව්‍යාපෘති පමණක් හඳුනාගත යුතුය. 2025 වර්ෂයෙන් ඉදිරියට ව්‍යාපෘති අඛණ්ඩ කිරීම කිසිදු අයුරකින් නොකළ යුතුය.

5.5 විමධ්‍යගත අයවැය වැඩසටහන 2025 මඟින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති වෙනුවෙන් ගෙවීමට සිදුවන සියලුම ආකාරයේ බදු හා වෙනත් ගෙවීම් මෙම වැඩසටහන යටතේ ලබාදෙන ප්‍රතිපාදන මඟින්ම ආවරණය කර ගත යුතු අතර ඒ සඳහා අමතර ප්‍රතිපාදන හිමි නොවේ.

5.6 මෙම වැඩසටහන පිළිබඳව අවශ්‍ය උපදෙස් සහ අවශ්‍ය තොරතුරු සඳහා **ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ, ප්‍රියන්ජිත් අබේසේකර** මහතා **(011-2484783 / 0718610488)** හා සම්බන්ධීකරණය කළ යුතුය.

**කේ. එම්. මහින්ද සිරිවර්ධන**
**ලේකම්**

පිටපත් -

1. ගරු පළාත් ආණ්ඩුකාරවරු - කාරුණික දැන ගැනීම පිණිස
2. සියලුම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරු - කාරුණික දැන ගැනීම පිණිස
3. ජනාධිපති ලේකම් - කාරුණික දැන ගැනීම පිණිස
4. අග්‍රාමාත්‍ය ලේකම් - කාරුණික දැන ගැනීම පිණිස
5. ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කාරුණික දැනගැනීම පිණිස

6. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් - කාරුණික දැනගැනීම පිණිස
7. විගණකාධිපති - විගණකාධිපති දෙපාර්තමේන්තුව - කාරුණික දැනගැනීම පිණිස
8. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව - කාරුණික දැනගැනීම හා අ.ක.ස
9. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අයවැය දෙපාර්තමේන්තුව - කාරුණික දැනගැනීම හා අ.ක.ස
10. අධ්‍යක්ෂ ජනරාල් - ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව - කාරුණික දැනගැනීම හා අ.ක.ස
11. අධ්‍යක්ෂ ජනරාල් - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව- කාරුණික දැනගැනීම හා අ.ක.ස
12. සියලුම දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂවරුන් - කාරුණික දැනගැනීම හා අ.ක.ස
13. සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් - කාරුණික දැනගැනීම හා අ.ක.ස

ඇමුණුම 1

සංවර්ධන අංශ

දේශීය නිෂ්පාදන ආර්ථිකයක් ළඟාකර ගැනීම පිණිස යෝජිත ප්‍රධාන ක්ෂේත්‍ර යටතේ පහත සඳහන් අංශයන්ට අදාළ කෙරෙහි ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාවය ලබාදී කටයුතු කිරීම පිළිබඳව අවධානය යොමුකෙර් .

1. කෘෂි, සත්ත්ව නිෂ්පාදන, ධීවර අංශයන්හි නිෂ්පාදන ඵලදායිතාව ඉහළ දැමීම හා අලෙවිකරණය සඳහා වන ව්‍යාපෘතීන්.
2. ආහාර ගබඩා, ශීත ගබඩා, කෘෂි නිෂ්පාදන ප්‍රවාහන අවශ්‍යතාවයන් ඇතුළු යටිතල පහසුකම් සංවර්ධනය.
3. කෘෂි සැකසුම් හා අගය එකතු කිරීමේ මධ්‍යස්ථාන නගා සිටුවීම සහ ඒ ආශ්‍රිත යටිතල පහසුකම් නගා සිටුවීම.
4. අලෙවිකරණ හා අළෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථාන හා ඒ ආශ්‍රිත යටිතල පහසුකම්.
5. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා වන තාක්ෂණික සහ නිපුණතා සංවර්ධන වැඩසටහන්
6. දේශීයව යොදා ගනු ලබන අමුද්‍රව්‍ය හරහා නිෂ්පාදන කර්මාන්තයන් ප්‍රවර්ධනයට අවශ්‍යවන පහසුකම් සැලසීම.
7. ග්‍රාමීය හා ප්‍රාදේශීය වශයෙන් සංචාරක කර්මාන්තය නගා සිටුවීම සඳහා වන මූලික යටිතල පහසුකම් සංවර්ධනය.
8. නිෂ්පාදන ආර්ථිකයක් උදෙසා අවශ්‍යවන පොදු යටිතල පහසුකම් සංවර්ධනය.

ඇමුණුම 2

විමධ්‍යගත අයවැය වැඩසටහන - 2025

| 1 | 2 | 3 |
|---|---|---|
| අනු අංකය | දිස්ත්‍රික්කය | දිස්ත්‍රික් ප්‍රතිපාදන රු.මි. |
| 1 | කොළඹ | 207 |
| 2 | ගම්පහ | 218 |
| 3 | කළුතර | 126 |
| 4 | මහනුවර | 138 |
| 5 | මාතලේ | 58 |
| 6 | නුවරඑළිය | 92 |
| 7 | ගාල්ල | 103 |
| 8 | මාතර | 80 |
| 9 | හම්බන්තොට | 80 |
| 10 | යාපනය | 56 |
| 11 | කිලිනොච්චි | 13 |
| 12 | වවුනියාව | 23 |
| 13 | මන්නාරම | 23 |
| 14 | මුලතිව් | 23 |
| 15 | මඩකලපුව | 58 |
| 16 | අම්පාර | 80 |
| 17 | ත්‍රිකුණාමලය | 46 |
| 18 | කුරුණෑගල | 172 |
| 19 | පුත්තලම | 92 |
| 20 | අනුරාධපුරය | 103 |
| 21 | පොළොන්නරුව | 58 |
| 22 | බදුල්ල | 103 |
| 23 | මොණරාගල | 69 |
| 24 | රත්නපුර | 126 |
| 25 | කෑගල්ල | 103 |
| එකතුව | | 2250 |

ඇමුණුම 3

# විමධ්‍යගත අයවැය වැඩසටහන - 2025

දිස්ත්‍රික්කය-

දිස්ත්‍රික්කයට වෙන්වන මුළු ප්‍රතිපාදනය -

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අ. අංකය | ව්‍යාපෘතියේ නම (Project Name) | ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු. (Total Cost) | ව්‍යාපෘතිය අයත්වන සංවර්ධන අංශය (ඇමුණුම 1 අනුව) | ව්‍යාපෘතිය අරමුණු (Objective) | ව්‍යාපෘතිය හරහා අපේක්ෂිත නිමැවුම් (Output) | ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාරකම් | ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන | | ව්‍යාපෘතිය හරහා අපේක්ෂිත නිමැවුම තිරසරව පවත්වාගෙනයාම සඳහා යෝජිත | | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ඇති සූදානම* 1 / 2 / 3 | අංක 13 - සූදානම අංක 3 නම්, එම ගැටළු නිරාකරණය කර ගැනීමට ගතනව කාලය සහ ක්‍රියාවලිය | ව්‍යාපෘතිය පිළිබඳ තොරතුරු ලබා ගැනීමට සම්බන්ධ කරගතහැකි නිලධාරියකුගේ නම, තනතුර හා දුරකථන අංකය |
| | | | | | | | | ප්‍රමුඛ ආයතනය | සම්බන්ධවන වෙනත් ආයතන | ක්‍රමවේදය | ආයතනික ව්‍යූහය | | | |
| 1 | | | | | | 1 | | | | | | | | |
| | | | | | | 2 | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| 2 | | | | | | 1 | | | | | | | | |
| | | | | | | 2 | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| 3 | | | | | | 1 | | | | | | | | |
| | | | | | | 2 | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | එකතුව | | | | | | | | | | | | | |

* - මූලික අවශ්‍යතාවන් සපුරාලීම හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ඇති සූදානම (ඉඩම්, විදුලිය, ජලය, මාර්ග, අමුද්‍රව්‍ය, වෙළඳපොල, මානව සම්පත, තාක්ෂණික සහය ඇතුළු) - අංක 1. ඉහළ සූදානම 2. මධ්‍යම සූදානම 3. අවම සූදානම

සකස් කලේ-

නිර්දේශය

.........................................................

දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂ

අනුමැතිය

.........................................................

දිස්ත්‍රික් ලේකම්

ඇමුණුම 04

## විමධ්‍යගත අයවැය වැඩසටහන 2025 - ක්‍රියාකාරී සැලැස්ම

| අනු අංකය | වැඩසටහන | ඉලක්කය | වගකීම |
|---|---|---|---|
| 01 | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව කැඳවා මෙම ජාතික වැඩසටහන සම්බන්ධයෙන් දැනුවත් කිරීම | **2025** පෙබරවාරි මස **07** වන දිනට පෙර | දිස්ත්‍රික් ලේකම්<br>දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂ<br>නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |
| 02 | සංවර්ධන යෝජනා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව මඟින් අනුමත කිරීම | **2025** පෙබරවාරි මස **25** වන දිනට පෙර | දිස්ත්‍රික් ලේකම්<br>දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂ<br>නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |
| 03 | ව්‍යාපෘති යෝජනා අනුමැති සහ ප්‍රතිපාදන සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම | **2025** පෙබරවාරි **28** වන දිනට පෙර | දිස්ත්‍රික් ලේකම්<br>දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂ |
| 04 | අනුමත යෝජනා නොවැළැක්විය හැකි හේතුවක් මත සංශෝධනය | **2025** අප්‍රේල් **30** වන දිනට පෙර | දිස්ත්‍රික් ලේකම්<br>දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂ |
| 05 | අනුමත කරන ලද ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කර වැඩ අවසන් කිරීම | **2025** නොවැම්බර් මස **15** වන දිනට පෙර | දිස්ත්‍රික් ලේකම්<br>දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂ.<br>ප්‍රාදේශීය ලේකම්<br>නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |
| 06 | ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන්වල මාසික භෞතික හා මූල්‍ය ප්‍රගතිය වාර්තා කිරීම | සති ප්‍රගති වාර්තා කිරීම | දිස්ත්‍රික් ලේකම්<br>දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂ<br>ප්‍රාදේශීය ලේකම් |
| | | මාසික ප්‍රගති වාර්තා ව්‍යාපෘති කළමණාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමුකිරීම | දිස්ත්‍රික් ලේකම්<br>දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂ |
| 07 | සමස්ත වැඩසටහන අධීක්ෂණය | මාසිකව | ජනාධිපති ලේකම් කාර්යාලය<br>අධ්‍යක්ෂ ජනරාල්, ව්‍යාපෘති කළමණාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව |